ද මැසිනොද් විදුහල කඳාන

# De Mazenod College - Kandana

## දේශපාලන විද්‍යාව

පැය 3

පළමුවාර පරීක්ෂණය

12 ශ්‍රේණිය

24 . 11 . 2016

අංක 1 සිට 14 තෙක් ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට හා අදාළව සපයන ලද ප්‍රකාශ පහකිනි. එම ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

01) දේශපාලන විද්‍යාව අධ්‍යනයේදී සැලකිලිමත් වන කරුණු වන්නේ,

A- රාජ්‍ය සහ ආණ්ඩුව
B- දේශපාලන බලය
C- පුද්ගලයින්ගේ දේශපාලන චර්යාව
D- ජනතාව ආණ්ඩුව හා රාජ්‍ය අතර පවත්නා සම්බන්ධතාව
E- ලෞකික ජීවිතයෙන් මිනිසුන් මුදවා ගැනීම

i. ABCD  iii. ABDE  v. ABCE
ii. BCDE  iv. ACDE

02) දේශපාලනය

A- බල අරගලයේ ප්‍රායෝගික ප්‍රකාශනය වේ
B- දේශපාලන, ආර්ථික හා සමාජ කරුණු පිළිබඳව පවතින ප්‍රතිවිරුද්ධ ආශාවන්ගේ ප්‍රථිඵලය වේ
C- පුද්ගලයින් දේශපාලඥයින් සහ දේශපාලන පක්ෂ විසින් කරුණු ලබන ක්‍රියාවක් වේ
D- මහත්වරුන්ගේ ක්‍රීඩාවක් ලෙසද සැලකේ
E- කාට කුමක් කුමන අවස්ථාවක කෙසේ හිමිවන්නේද යන්න තීරණය කෙරෙන ක්‍රියාව වේ

i. ABCD  iii. ABDE  v. ABCE
ii. BCDE  iv. ACDE

03) චර්යාවාදය

A- නිරීක්ෂණය කළ හැකි මානව චර්යාව පමණක් පදනම් කරගෙන සමාජ න්‍යායන් ගොඩනැගිය යුතුය යන විශ්වාසය මත ගොඩනගා ඇත
B- දේශපාලන විද්‍යාව සැලකිලිමත් වන අවසාන අගය කිරීම් සහිත කරුණු අධ්‍යයනය කිරීම සඳහා වඩාත් සැලකිලිමත් විය යුතු බව අවධාරණය කර ඇත
C- පර්යේෂණ හා සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කිරීම මගින් ප්‍රමාණීකරණය කළ හැකි දත්ත එක්රැස් කිරීම හා සම්බන්ධ වේ.
D- අනාවැකි පළ කිරීමේ හැකියාව සහිත ප්‍රත්‍යක්ෂ මූලික න්‍යායන් ගොඩනැගීමට උත්සහ දරා ඇත.
E- සත්‍යතාව පරීක්ෂා කළ හැකි විස්තරාත්මක න්‍යායන් මත විද්‍යාත්මක දැනුම වර්ධනය කළ හැකි බව අවධාරණය කර ඇත

i. ABCD  iii. ABDE  v. ABCE
ii. BCDE  iv. ACDE

04) රාජ්‍යය

A- දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජය වේ
B- ජනතාවගේ සාමූහික කැමැත්ත නියෝජනය කරන එජන්තවරයා වේ
C- දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කළ උසස්ම දේශපාලන සංවිධානය වේ
D- ස්වාධිපති බලය නමින් හැඳින්වෙන උත්තරීතර බලයේ තනි හිමිකරුවා වේ
E- භූමිය ජනගහනය ආණ්ඩුව හා ස්වාධිපතිබලය යන මූලික සාධකවලින් සමන්විත වේ

i. ABCD  iii. ABDE  v. ABCE
ii. BCDE  iv. ACDE

05) ජාතික රාජ්‍යය

A- සංස්කෘතික විවිධත්වය සහ දේශපාලන අසමගිකම ආරක්ෂා කරන්නාවූ රාජ්‍ය ක්‍රමය ලෙස පොදු පිළිගැනීමකට ලක්ව ඇත

B- පුරවැසිභාවය සහ ජාතිකත්වය සමග සම්බන්ධ දේශපාලන බැඳීම් මත ගොඩනගා ඇති ස්වාධීන දේශපාලන සමාජය වේ

C- බහු ජාතික අධිරාජ්‍ය ක්‍රමයට සහ නාගරික රාජ්‍ය ක්‍රමයට එරෙහිව විකල්පයක් ලෙස 16 වන සියවසේදී පැන නැගුණු රාජ්‍ය ක්‍රමයක් වේ

D- සෑම ජාතියකටම රාජ්‍යයක් සහ සමස්ත ජාතිකයටම එක් රාජ්‍යයක් යන මූලධර්මය මත ගොඩනැගී ඇත.

E- අන්තර්ජාතික දේශපාලනයේ මූලික ඒකකය ලෙස පොදුවේ පිළිගනු ලැබේ

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

06) ස්වාධිපති න්‍යාය

A- රාජ්‍යයේ බලය ගැන සලකා බලන න්‍යාය වේ

B- අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය උත්තරීතරභාවයන් රාජ්‍යයට තිබෙන බව අවධාරණය කර ඇත

C- රාජ්‍යයේ නීතිවලට සුජාතභාවය සපයනු ලැබේ

D- ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය හා පැවැත්ම සාධාරණීකරණය කර ඇත

E- දෙවියන් වහන්සේ දේශපාලන බලයේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස පිළිගෙන ඇත.

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

07) ආණ්ඩුව

A- රාජ්‍යයේ ස්වාමියා වේ

B- රාජ්‍යයේ මොළය ලෙස සලකනු ලැබේ

C- රාජ්‍ය වෙනුවෙන් ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ඒජන්තවරයා වේ

D- රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වේ

E- රාජ්‍යය සහ ජනතාව එකට යා කරන මාධ්‍ය වේ

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

08) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණය වන්නේ,

A- එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත ක්‍රියාත්මක වීම

B- විධායකය ව්‍යවස්ථාදායකය හා අධිකරනය අතර බලය බෙදා තිබීම

C- ව්‍යවස්ථාදායකය හා විධායකය මත පතිත වී ඇති අධිකරණයේ ආධිපත්‍යය

D- පාලකයන් ජනතාවට වගකීම

E- කලින් කල පවත්වන තරගකාරී මැතිවරණ මගින් ජනතාව විසින් පාකලයන් තෝරාපත් කිරීම

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

09) සමාජවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ

A- ආණ්ඩුව එක් පක්ෂයක් මත පමණක් ගොඩනගා තිබීම

B- ඒකබල වාදී පාලන ක්‍රමයක් පැවතීම

C- කොමියුනිස්ට් සමාජ ක්‍රමයක් ගොඩනැගීම සඳහා ක්‍රියා කිරීම

D- සමාජ බහුවිධතාව ප්‍රතික්ෂේප කිරීම

E- තම කැමැත්ත අනුව ආණ්ඩුව වෙනස් කිරීමට ජනතාවට බලය තිබීම

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

Learning Resource Centre
De Mazenod College
Kandana

10) ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණය වන්නේ,

A- පැහැදිලි දේශපාලන ආර්ථික හා සමාජ දර්ශනයක් නොමැති වීම
B- තරගකාරි දේශපාලන පක්ෂ ක්‍රමයක් නොමැති වීම
C- අනුග්‍රාහක පක් කිරීම් මත ආණ්ඩුව පැවතීම
D- කලින් කල පවත්වන මැතිවරණ වලින් ජනතාව විසින් පාලකයින් තෝරා ගැනීම
E- පාලකයා විසින් තම අභිමතය පරිදි රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

11) ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂන වන්නේ,

A- මධ්‍යම ආණ්ඩුවේ ආයතන තුළ දේශපාලන බල අධිකාරිය ඒකරාශි වීම
B- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මිශ්‍ර බලය අවධාරිත කරන ලද පළාත් පාලන ආණ්ඩුක්‍රමයක පැවැත්ම
C- ස්වාධිපති බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරිත්වය
D- මධ්‍යම ආණ්ඩුව මගින් පමණක් ජාතියේ ආශාවන් ප්‍රකාශ කිරීම
E- එක් පුරවැසිභාවයක් නීති ක්‍රමයක් අධිකරණ ක්‍රමයක් හා සිවිල් සේවයක් පැවතීම

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

12) සන්ධීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ,

A- එකිනෙකට වෙනස් තල දෙකක ආණ්ඩු පැවතීම
B- මධ්‍ය හා පරිධිය ස්වාධිපති බලය හවුලේ ක්‍රියාවට නැංවීම
C- පරිධියේ ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත් වීම
D- මධ්‍යයේ සහ පරිධියේ බලතල කාර්ය සහ වගකීම් මූලික නීතිය මගින් බෙදා හැර තිබීම
E- මධ්‍ය සහ පරිධිය අතර ඇතිවන ආරවුල් විසඳීම සඳහා බේරුම්කරුවකු ලෙස ක්‍රියාකරන ස්වාධීන අධිකරණයක පැවැත්ම

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

13) කැබිනට් ආණ්ඩුක්‍රමයක සත්‍ය විධායකය

A- ව්‍යවස්ථාදායකය විසින් එහි බහුතර පක්ෂයේ සාමාජිකයින් අතුරින් තෝරා පත්කරනු ලැබේ
B- දේශපාලන විධායකය ලෙසද හඳුන්වනු ලැබේ
C- නාමික විධායකයේ නාමයෙන් විධායක කාර්යයන් ක්‍රියාවට නැංවීම පැවරී ඇත
D- විධායක කාර්යයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී ඇත
E- ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවන් මගින් ඉවත් කළ හැකිය

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

14) ජනාධිපති ආණ්ඩුක්‍රමය

A- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා යොදා ගැනෙන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට ඇති එක් විකල්පයක් වේ
B- ගොඩනැගී තිබෙන්නේ ව්‍යවස්ථාදායකට වග නොකියන ජනාධිපති නමින් හඳුන්වන විධායකයක් පදනම් කරගෙනය
C- වඩාත් කාර්යක්ෂම නමුත් ප්‍රජාතන්ත්‍රවාදය අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ
D- ගොඩනැගී තිබෙන මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පවතින දුරස්ථ සම්බන්ධතාවයයි
E- ලෝකයට ප්‍රථම වරට හඳුන්වා දුන්නේ 1958 ඩිගෝල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

i. ABCD
ii. BCDE
iii. ABDE
iv. ACDE
v. ABCE

පහත සඳහන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

15) දේශපාලන විද්‍යාවේ පියා ලෙස සලකනු ලබන්නේ කවුරුන්ද ?
16) දේශපාලන විද්‍යාව අයත් වන්නේ ස්වභා විද්‍යාවටද ? සමාජ විද්‍යාවටද ?
17) බල වාදයේ පියා ලෙස සලකනු ලබනනේ කවුරුන්ද ?
18) ක්‍රි.පු. 7-15 දක්වා දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය යටතේ අවධානයට යොමු වූ මාතෘකා දෙකක් දක්වන්න.
19) රාජ්‍ය යනු කුමක්ද ?
20) ආණ්ඩුව යනු කුමක්ද ?
21) ලොව පවතින ආණ්ඩු වර්ග 2ක් දක්වන්න.
22) රාජ්‍යයේ අනිවාර්ය ලක්ෂණ 4 නම් කරන්න.
23) 1688 දී එංගලන්තයේ ඇතිවූ විප්ලවය හඳුන්වන නම කුමක්ද ?
24) ජාතික රාජ්‍ය බිහිවීම කෙරෙහි බලපෑ සාධක දෙකක් දක්වන්න.
25) රාජ්‍ය සහ අනෙකුත් සමාගම් අතර දැකිය හැකි ප්‍රධාන අසමානතාවයන් දක්වන්න.
26) ................................ අධ්‍යයන ක්‍රමය අන්තර් විෂයාත්මක සම්බන්ධතාවය තුළින් ගොඩනැගුණු ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැක
27) ගෝත්‍ර රාජ්‍ය ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් දක්වන්න.
28) රාජ්‍ය පිළිබඳ සුභසාධකවාදී රාජ්‍ය සංකල්පය යටතේ රාජයේ ප්‍රධානතම කාර්යය කුමක්ද ?
29) අවම රාජ්‍ය සංකල්පය යටතේ රජයේ ප්‍රධානතම කාර්යය කුමක්ද ?
30) කාල් මාක්ස්ට අනුව රාජ්‍ය උපත ලැබවේ කුමන යුගයේද ?
31) ආණ්ඩුවේ බලය යෙදීමේ ප්‍රධාන උපකරණ දෙකක් දක්වන්න.
32) ආණ්ඩුවේ බලය සංවරණය වන ආකාර දෙකක් දක්වන්න.
33) ව්‍යවස්ථානුකූලවාදය යනු කුමක්ද ?
34) ව්‍යවස්ථාවක ඇතුළත් විය යුතු කරුණු දෙකක් දක්වන්න.
35) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග කල හැකි වඩාත් අර්ථාන්විත වර්ගීකරණය කුමක්ද ?
36) කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකයේ නායකයා කවුරුන්ද ?
37) ජනාධිපති ආණ්ඩුක්‍රමයක විධායකයේ නායකයා කවුරුන්ද ?
38) සහ සන්ධිය ආණ්ඩුක්‍රමයක් සඳහා ඉදිරිපත් කළ හැකි හොඳම නිදර්ශනය කුමක්ද ?
39) ඇමරිකාවේ වත්මන් ජනාධිපතිවරයා කවුරුන්ද ? ඔහු පත්ව ඇත්තේ පක්ෂයෙන්ද ?
40) ලංකාවේ වත්මන් දේශපාලන ප්‍රවාහටය පිළිබඳව ඔබට ප්‍රකාශ කළ හැක්කේ කුමක්ද කෙටියෙන් සඳහන් කරන්න.

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01)
1. දේශපාලන විද්‍යාව ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රධාන වාසි මොනවාද ?
2. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳව විමසීමක් කරන්න.

02)
1. '' දේශපාලන විද්‍යාව විද්‍යාවක් වේ '' මෙම ප්‍රකාශයට එකඟ වන්නේද ? හේතු දක්වන්න.
2. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කළ හැකි ප්‍රධාන අධ්‍යයන ක්‍රම මොනවාද ?

03) පහත සඳහන් ඒවායේ අසමානතා පරීක්ෂණ කරන්න.
1. රාජ්‍ය හා සමාජය
2. රාජ්‍ය හා ආණ්ඩුව
3. රාජ්‍ය හා අනෙකුත් සමාගම්

04) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
1. රාජ්‍ය පිළිබඳ ලිබරල්වාදී මතය
2. රාජ්‍ය පිළිබඳ සමාජවාදී මතය
3. රාජ්‍ය පිළිබඳ ෆැසිස්ට්වාදී මතය

05) '' ජාතිය සහ ජාතිකත්වය '' යන මාතෘකාව ඇසුරෙන් රචනයක් ලියන්න.

06)
1. රාජ්‍යයේ සම්භවය පිළිබඳව ඉදිරිපත් වී ඇති මතවාදයන් මොනවාද ?
2. මෙම මතවාදයන් අතුරින් පැරණිතම මතවාදය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

07)
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද ?
2. ව්‍යවස්ථා වර්ග කොට දක්වන්නේ කෙසේද ? මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.